# මහජන බැංකුව

### මූල්‍ය ක්ෂේත්‍රයට සාර්ථක පිවිසුමක්

මූල්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාශීලී හා ප්‍රමුඛතම රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව තම ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කර ගැනීමේ කාර්යයෙහි නිරතව සිටී. එම ප්‍රයාසය සපුරා ගැනීමෙහිලා අප සමඟ ඉදිරියට යාමට අැප කැප විය හැකි, වගකීම් දැරිය හැකි, ඉහළ කාර්ය සාධනයක් අපේක්ෂා කළ හැකි, හෙට දවසේ ඇවැසිතම නායකත්වයට උරදිය හැකි උද්‍යෝගමත් තරුණ තරුණියන් අපට අවශ්‍ය වී තිබේ. මෙම ගුණාංග ඔබ සතු නම්, අප හා එක්වන්නට මෙන්න මහඟු අවස්ථාවක්.

# ගනුදෙනුකාර සේවා සහායක

**අවශ්‍ය සුදුසුකම්**

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) විෂයන් 06 ක් එකවර සම්මාන සාමාර්ථ 05 ක් සහිතව සමත් විය යුතුය. සම්මාන සාමාර්ථ 05 අතුරින් සිංහල/දෙමළ භාෂාව, ගණිතය විෂය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම අනිවාර්ය වේ.

**හෝ**

- Edexcel හෝ Cambridge සාමාන්‍ය පෙළ විභාගයෙන් එකවර අවම වශයෙන් විෂයන් 06ක් සමත් විය යුතු අතර, ඉංග්‍රීසි හා ගණිතය ඇතුලත්ව විෂයන් 06 ක් සදහා C සාමාර්ථ ලබා තිබීම අනිවාර්යය වේ.

**සහ**

- අ.පො.ස.(උ.පෙළ) එකවර අවම වශයෙන් විෂයන් 03 ක් සඳහා සාමාන්‍ය සාමාර්ථ (සාමාන්‍ය ඉංග්‍රීසි විෂය හැර) ලබා තිබිය යුතුය. කෙසේ වුවද සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සමත් වීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**හෝ**

- Edexcel හෝ Cambridge උසස් පෙළ විභාගයෙන් එකවර අවම වශයෙන් E සාමාර්ථ 03 ක් සහිතව සමත් වී තිබිය යුතුය.

**වයස**

- සියලු අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 23 ට නොවැඩි විය යුතුය. ( ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2007.07.27 දින හෝ ඊට පෙර හා 2002.07.27 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි)

**භාෂා හැකියාව හා කුසලතා**

- සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්හි මනා සන්නිවේදන හැකියාව
- සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් රාජකාරී කටයුතු සිදු කිරීමේ හැකියාව
- පරිගණක සාක්ෂරතාවය
- ඉහළ අන්තර් පුද්ගල සම්බන්ධතා හැකියාව
- කාර්ය බහුල පරිසරයක ඇති පීඩනයට ඔරොත්තු දීමේ හැකියාව සහ ඉහළ අව්‍යාජත්වය
- ඉලක්ක ගතව කටයුතු කිරීමේ හැකියාව සහ බහු කුසලතා
- සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සහ සති අන්ත රාජකාරී කටයුතු කිරීමට ඇති කැමැත්ත

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

- මෙම යෝජනා ක්‍රමය යටතේ බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 02 ක කොන්ත්‍රාත් පදනම මත සියලු බැංකු කටයුතු ආවරණය වන පරිදි විධිමත් හා අංග සම්පූර්ණ පුහුණුවක් සදහා යොමු කෙරේ.
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ස්ථානීය අධීක්ෂිත මාර්ගගත පරීක්ෂණයකින් ( Onsite, Supervised, Online Examination) පසුව ලැයිස්තුගත කරනු ලබන (shortlisted) අපේක්ෂකයින්, බැංකුව විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක්/පරීක්ෂණ මගින් තෝරාගනු ලැබේ.
- තෝරා ගැනීම දිස්ත්‍රික් පදනම යටතේ කුසලතා අනුපිළිවෙල අනුව ඒ ඒ දිස්ත්‍රික්කයේ හඳුනාගත් පුරප්පාඩු ප්‍රමාණයට යටත්ව සිදු කරනු ලබයි.
- ස්ථානීය අධීක්ෂිත මාර්ගගත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 1 කින් සමන්විත වේ. එම පරීක්ෂණයෙහි විෂය පථය පහත පරිදි වේ.

| විෂය | ප්‍රශ්න වර්ගීකරණය | ප්‍රශ්න සංඛ්‍යාව | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|---|
| බැංකුකරණය සහ මූල්‍ය, තොරතුරු තාක්ෂණ දැනුම, සාමාන්‍ය දැනීම, සංඛ්‍යාන නිපුණතා, මනෝමිතික පරීක්ෂණ, අභියෝගතා පරීක්ෂණ, බුද්ධි පරීක්ෂණ | බහුවරණ | 50 | පැය 01 | 100 |

- මෙය පූර්ණකාලීන රැකියාවක් බැවින් කිසියම් විශ්ව විද්‍යාලයක උපාධි පාඨමාලාවක් හදාරන සිසුන් හෝ කිසියම් විශ්ව විද්‍යාලයක යම් පාඨමාලාවක් හැදෑරීම සඳහා තෝරාගත් සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.
- අයදුම්කරුවෙකු විභාගය සමත් වුවද බැංකුව විසින් අපේක්ෂිත යෝග්‍යතා නිර්ණායක අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම ඉල්ලුම්පතක් බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවෙකු විසින් සහතික පරීක්ෂා කරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සනාථ කිරීම සඳහා ලේඛණමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ / ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- විභාගය භාෂා මාධ්‍ය තුනෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) පවත්වන අතර, අයදුම්කරුවන්ට තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැක.
- තෝරා ගනු ලබන ගනුදෙනුකාර සේවා සහායකයින් මුලින්ම අනුයුක්ත කරනු ලබන දිස්ත්‍රික්කයෙහි අඛණ්ඩව කොන්ත්‍රාත් කාලය තුළ සේවය කළ යුතුය. බැංකුව විසින් ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට තීරණය කළහොත් අදාල දිස්ත්‍රික්කයෙහි වසර 10 ක සමුච්චිත සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය.
- ඉහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටින ලෙස උපදෙස් දෙන අතර, එම යෝග්‍යතා නිර්නායක සපුරා නොමැති අයදුම්කරුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අදියරයකදී නුසුදුස්සෙකු කිරීමේ අයිතිය බැංකුව සතුය.

**පුහුණු දීමනාව**

- පුහුණු කාලය තුළ මාසික පුහුණු දීමනාවක් ගෙවනු ලැබේ.

**අයදුම්පත්**

අදාල අයදුම්පත ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙහි වෙබ් අඩවියෙහි **https://ou.ac.lk/peoplesbank-csa/** දිගුව හරහා සහ මහජන බැංකු වෙබ් අඩවියෙහි “රැකියා අවස්ථා” (careers) තීරයෙහි පළ කර ඇත. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට ප්‍රථම අයදුම්පත් මාර්ගගතව පමණක් ඉදිරිපත් කළ හැක.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වනුයේ 2025.07.27 දින වේ.** මෙම මාර්ගගත ක්‍රමය හැර වෙනත් ක්‍රමවේදයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ භාර ගනු නොලැබේ.

අයදුම්පත් ඉදිරිපත් කිරීමට අදාල උපදෙස් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල වෙබ් අඩවියෙහි පල කර ඇති අතර, එම උපදෙස් සැලකිල්ලෙන් කියවා අදාල අයදුම්පත් සම්පූර්ණ කිරීම අයදුම්කරුගේ වගකීම වේ.

සියලුම අයදුම්පත් අතිශය රහස්‍යභාවකින් යුතුව සලකනු ලබන අතර, බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් සිදු කිරීම අදාල තනතුර සඳහා නුසුදුස්සෙකු සේ සැලකීමට හේතුවනු ඇත.

සියලු අසම්පූර්ණ සහ නියමිත ආකාරයට අනුව ඉදිරිපත් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් මෙම තනතුර සඳහා කැඳවීමට බැංකුවට අයිතිය ඇත.

පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීම සහ මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම මහජන බැංකුව සතු වන්නේය.

බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව බැංකුව විසින් ඔබේ තොරතුරු වල පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්)**
**මහජන බැංකුව**
**ප්‍රධාන කාර්යාලය**
**අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02.**

www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE
PEOPLE'S BANK
Pride of the Nation
AA-(lka) Fitch Rating, AAA Brand Finance Rating
People's Bank is a Licensed Commercial Bank supervised by the Central Bank of Sri Lanka